## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධන අංක - 02

| ඡේද අංකය | දැනට පවතින පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 15 | **අන්තර් කාලීන විධිවිධාන** | 15 | **අන්තර් කාලීන විධිවිධාන** | |
| | - | 15.4 | MN-06-2016 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීමේදී පළමුවන අවස්ථාව සඳහා පමණක් වලංගු වන පරිදි අදාළ අනුමත තනතුරු 06 සඳහා මධ්‍යම පළාත් ස්ථිර රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් අතුරින් ව්‍යවස්ථා සංග්‍රහයේ 7.3.1.2 යටතේ වන සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ඔවුන්ගේ පෙර සේවයට අගතියක් නොවන පරිදි උපරිම වයස් සීමාව නොසලකා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.3.1.4 යටතේ සඳහන් බඳවා ගැනීමේ ක්‍රමවේදයට බඳවා ගැනීම.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022 - 03 - 09 දින අනුමත ... ආණ්ඩුකාර ලේකම් | 01. 2019.09.04 දින සිට අනුමත වී ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව මේ වන විට කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොමැත.<br><br>02. මෙම තනතුර MN-06 ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වන අතර මධ්‍යම පළාත් ස්ථිර රාජ්‍ය සේවයේ සිටින ව්‍යවස්ථා සංග්‍රහයේ 7.3.1.2 යටතේ වන සුදුසුකම් සම්පූර්ණ කර ඇති නමුත් වයස අවුරුදු 35 ඉක්මවූ MN-06 වැටුප් පරිමාණයට පහළ ස්ථිරවල සේවය කරන නිලධාරීන් සිටින බැවින්, ඔවුන් සඳහා මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ අවස්ථාවක් නොලැබී යාම තුළ අගතියක් සිදුවීම වැළැක්වීමට මෙම සංශෝධන හේතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022-03-09 දින අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | 03. රටේ පවතින තත්ත්වය හා බඳවා ගැනීමේ ප්‍රතිපත්ති මත විවෘත පදනමින් බඳවා ගැනීම මෙම අවස්ථාවේ සිදු කළ නොහැකි බැවින් සීමිත පදනමට අදාළ උසස්වීම ලෙස අදාළ සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් කිසිවෙකුත් මධ්‍යම පළාත තුළ නොමැති බැවින් හා පවතින දැඩි අවශ්‍යතාවය අනුව පළමු අවස්ථාව සඳහා පමණක් අදාළ වන පරිදි මෙම සංශෝධනය සිදු කිරීම.<br><br>04. මෙය පළමු අවස්ථාව සඳහා පමණක් වන අන්තර් කාලීන විධිවිධානයක් වන බැවින් එමගින් විවෘත පදනම යටතේ හෝ සීමිත පදනම මත ඉදිරියේදී බඳවා ගැනීමට නියමිත තනතුරු හා සන්නිවේදන නිලධාරීන් හට අගතියක් සිදු නොවීම. |
| 7.2.2.2 | වෘත්තීය සුදුසුකම් :<br>I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක්/ උසස් ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම. | 7.2.2.2 | වෘත්තීය සුදුසුකම් :<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක් / උසස් ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම. | 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25 අ වන වගන්තිය මගින් නියම කර ඇති විධිවිධාන ප්‍රකාරව උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා හට උසස් අධ්‍යාපන ආයතන උපාධි පිරිනැමීමේ ආයතන වශයෙන් පිළිගැනීම සඳහා බලය පැවරී ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HE/NS/09/215 හා 2021.09.29 දිනැති ලිපිය මගින් දන්වා ඇති බැවින් ඒ අනුව සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කරන ලෙස මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක. CPC/CS/2/7/SOR/G52021 හා 2021. 10. 14 දිනැති ලිපිය මගින් දැනුම් දීම. |

| | | | | |
|---|---|---|---|---|
| | හෝ<br><br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක/ තොරතුරු තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හෝ පැය 1500 කට නොඅඩු පාඨමාලාවක් හෝ හදාරා සම්පූර්ණ කර තිබීම.<br><br>හෝ<br><br>III. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන එම කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයකින් හෝ පාර්ලිමේන්තුවේ සම්මත පනතක් මගින් ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින්,<br><br>අ) පරිගණක / තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටම හෝ ඊට ඉහළ සහතිකය ලබා තිබීම.<br><br>හෝ<br><br>ආ) පැය 1500 ට නොඅඩු පරිගණක / තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම. | | හෝ<br><br>II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක/තොරතුරු තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පාඨමාලාවක් හෝ පැය 1500 කට නොඅඩු පාඨමාලාවක් හෝ හදාරා සම්පූර්ණ කර තිබීම.<br><br>හෝ<br><br>III. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන එම කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයකින් හෝ පාර්ලිමේන්තුවේ සම්මත පනතක් මගින් ස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින්,<br><br>අ) පරිගණක / තොරතුරු තාක්ෂණ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටම හෝ ඊට ඉහළ සහතිකය ලබා තිබීම.<br><br>හෝ<br><br>ආ) පැය 1500 ට නොඅඩු පරිගණක/ තොරතුරු තාක්ෂණ/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබීම. | ගරු ආණ්ඩුකා…තුමා විසින්<br>2022-03-09 දින<br>අනුම…<br>ආණ්ඩුකාර ලේකම් |

| | | | | |
|---|---|---|---|---|
| 7.3.1.2<br><br>7.3.1.2.1 | අධ්‍යාපන සුදුසුකම් :<br><br>සුදුසුකම් :<br><br>(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>(2) I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)<br><br>සහ | 7.3.1.2<br><br>7.3.1.2.1 | අධ්‍යාපන සුදුසුකම් :<br><br>සුදුසුකම් :<br><br>(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>(2) I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)<br><br>සහ | 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25 අ වන වගන්තිය මගින් නියම කර ඇති විධිවිධාන ප්‍රකාරව උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා හට උසස් අධ්‍යාපන ආයතන උපාධි පිරිනැමීමේ ආයතන වශයෙන් පිළිගැනීම සඳහා බලය පැවරී ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HE/NS/09/215 හා 2021.09.29 දිනැති ලිපිය මගින් දන්වා ඇති බැවින් ඒ අනුව සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කරන ලෙස මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක. CPC/CS/2/7/SOR/ G5/2021 හා 2021.10.14 දිනැති ලිපිය මගින් දැනුම් දීම.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022-03-... දින අනුම...<br>ආණ්ඩුකාර ලේකම් |

| | | | | |
|---|---|---|---|---|
| | II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. | | II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. | |
| | හෝ | | හෝ | |
| | (3) I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම . | | (3) I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, උපාධියක් ලබා තිබීම . | |
| | සහ | | සහ | |
| | II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම . | | II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම . | ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022-03-0[illegible] දින අනුම[illegible] ආණ්ඩුකාර ලේකම් |

<table>
<tr>
<td></td>
<td>හෝ<br><br>(4) I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) (07) මට්ටම හෝ ඊට ඉහළ NVQ සහතිකයක් ලබා තිබීම .<br><br>සහ<br><br>II. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.</td>
<td></td>
<td>හෝ<br><br>(4) I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) (07) මට්ටම හෝ ඊට ඉහළ NVQ සහතිකයක් ලබා තිබීම .<br><br>සහ<br><br>II. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.</td>
<td></td>
</tr>
<tr>
<td>09<br><br>09.1</td>
<td>භාෂා ප්‍රවීණතාවය
<table>
<tr><td>භාෂාව</td><td>ලබා ගත යුතු ප්‍රවීණතාවය</td></tr>
<tr><td>1.රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය.</td></tr>
<tr><td>2. අනෙක් රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතය.</td></tr>
<tr><td>3. සන්ධාන භාෂාව</td><td>2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් බඳවාගෙන වසර තුන (03) ක් තුළ අ.පො.ස. (සා පෙළ) සම්මාන සාමාර්ථයක් ලබා ගත යුතුය.</td></tr>
</table></td>
<td>09<br><br>09.1</td>
<td>භාෂා ප්‍රවීණතාවය
<table>
<tr><td>භාෂාව</td><td>ලබා ගත යුතු ප්‍රවීණතාවය</td></tr>
<tr><td>1.රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.</td></tr>
<tr><td>2. අනෙක් රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි විධිවිධාන හා කලින් කලට ඒ සඳහා කෙරෙන සංශෝධන අනුව, අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතය.</td></tr>
<tr><td>3. සන්ධාන භාෂාව</td><td>2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් බඳවාගෙන වසර තුන (03) ක් තුළ අ.පො.ස. (සා පෙළ) සම්මාන සාමාර්ථයක් ලබා ගත යුතුය.</td></tr>
</table></td>
<td>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක EST/2/05/POL/0087 හා 2020.10.16 දිනැති ලිපිය මගින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ සංශෝධන අනුව.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින්<br>2022-03-07 දින<br>අනුමත ...<br>ආණ්ඩුකාර ලේකම්</td>
</tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 10<br><br>10.1<br><br>10.1.1<br><br>10.1.1.1 | ශ්‍රේණි උසස් කිරීම<br><br>3 පන්තියේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම<br><br>සාමාන්‍ය කාර්ය සාධනය අනුව<br><br>සපුරාලිය යුතු සුදුසුකම් :<br><br>IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | 10<br><br>10.1<br><br>10.1.1<br><br>10.1.1.1 | ශ්‍රේණි උසස් කිරීම<br><br>3 පන්තියේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම<br><br>සාමාන්‍ය කාර්ය සාධනය අනුව<br><br>සපුරාලිය යුතු සුදුසුකම් :<br><br>IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධාන අනුව, විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/05-03/03/2019 හා 2020.01.01 දිනැති ලිපිය මගින් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලය සම්බන්ධව වන විධිවිධානයන් සංශෝධනය කිරීම අනුව. |
| 10.2<br><br>10.2.1<br><br>10.2.1.1 | 3 පන්තියේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම<br><br>සාමාන්‍ය කාර්ය සාධනය අනුව<br><br>සපුරාලිය යුතු සුදුසුකම් :<br><br>III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | 10.2<br><br>10.2.1<br><br>10.2.1.1 | 3 පන්තියේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම<br><br>සාමාන්‍ය කාර්ය සාධනය අනුව<br><br>සපුරාලිය යුතු සුදුසුකම් :<br><br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධාන අනුව, විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/05-03/03/2019 හා 2020.01.01 දිනැති ලිපිය මගින් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලය සම්බන්ධව වන විධිවිධානයන් සංශෝධනය කිරීම අනුව. |
| 10.3<br><br>10.3.1<br><br>10.3.1.1 | 2 පන්තියේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම<br><br>සාමාන්‍ය කාර්ය සාධනය අනුව<br><br>සපුරාලිය යුතු සුදුසුකම් :<br><br>I. පත්වීම ස්ථිර කර තිබීම.<br>II. සේවා ගණයේ 2 පන්තියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම. | 10.3<br><br>10.3.1<br><br>10.3.1.1 | 2 පන්තියේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම<br><br>සාමාන්‍ය කාර්ය සාධනය අනුව<br><br>සපුරාලිය යුතු සුදුසුකම් :<br><br>I. පත්වීම ස්ථිර කර තිබීම.<br>II. සේවා ගණයේ 2 පන්තියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම. | 1. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/05-03/03/2019 හා 2020.01.01 දිනැති ලිපිය මගින් නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලය සම්බන්ධව වන විධිවිධානයන් සංශෝධනය කිරීම අනුව. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022 - 03 - 09 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | | |
|---|---|---|---|---|
| | IV. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම. | | III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම. | 2. 10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් යටතේ අනු අංක කිරීමේ දී මුද්‍රණ දෝෂයක් හේතුවෙන් I, II, IV,V,VI පසුව නැවත VI ලෙස අංක කර ඇති බැවින් I සිට VI දක්වා නිවැරදිව පිළිවෙලින් අංක කිරීම. |
| | V. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | | IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධාන අනුව, විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. | |
| | VI. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම. | | V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම. | |
| | VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම. | | VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම. | |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : - නිර්දේශ කරමු.

01. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ........................................

02. ඩබ්ලිව්.එම්.එස්.ඕ. වීරකෝන් මහතා (සාමාජික) ........................................

03. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ........................................

04. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ........................................

05. එච්.එම්.බී.ආර්. හේරත් මහතා (සාමාජික) ........................................

06 ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ........................................

07. පී.ටී.ජී.ගුණතිලක මයා (සාමාජික) ........................................

දිනය ..2022.02.08..

ආණ්ඩුකාර ලේකම්,

..2022.02.08.. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක ..2022/205.. යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධන අංක - 02 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය ..2022.02.11..

........................................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව

ටී.ඒ.ඩී.ඩබ්ලිව්. දයානන්ද
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.

2022.03.09

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත